**ජාතික අධ්‍යාපන ආයතනය**

**අතිරේක භාෂා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව 2022**

# Diploma in Additional Language Improvement Program 2022

**සිංහල/දෙමළ/ඉංග්‍රීසි**

**SLQF Level-3**

ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන අතිරේක භාෂා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ප්‍රවේශ සුදුසුකම්**

- අ.පො.ස. (උසස්.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම.

**සහ**

- ශ්‍රී ලංකා ගුරු සේවයේ /විදුහල්පති සේවයේ/ ගුරු උපදේශක සේවයේ /ගුරු අධ්‍යාපනඥ සේවයේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ පිරිවෙනක / රජයේ අනුමත පෞද්ගලික පාසලක හෝ උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වීම.

**පාඨමාලාවේ ස්වභාවය**

- සිංහල මාධ්‍ය අයදුම්කරුවන් සඳහා දෙමළ භාෂා පාඨමාලාවක් ද දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් සඳහා සිංහල භාෂා පාඨමාලාවක් ද ඊට අමතරව ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් ද පැවැත්වේ.
- මෙය සති අන්ත හා පාසල් නිවාඩු කාලවල දී පවත්වනු ලබන අර්ධ කාලීන පාඨමාලාවක් වන අතර පාඨමාලා කාලය අවුරුද්දකි.
- මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දේශන පැවැත්වේ.

**පාඨමාලා ගාස්තු**

අයදුම්පත් ගාස්තුව රු. 500/= කි. ලියාපදිංචි ගාස්තුව රු. 1,000/= කි. පාඨමාලා ගාස්තුව රු. 30,000/= ක් වන අතර එය වාරික දෙකකින් ගෙවිය යුතුය. පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී ලියාපදිංචි ගාස්තුව රු:1000/-ක් සහ පළමු වාරිකය වන රු. 15,000/= ක් ගෙවිය යුතු ය. එයට අමතරව අවසාන විභාගය පැවැත්වීමට පෙර විභාග ගාස්තු සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ යුතුය.

**අයදුම් කිරීම**

2022 නොවැබර් මස 10 දිනට පෙර ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියේ (www.nie.lk) https://forms.gle/YgihSNuhfuCkrY2s9 (Link) එක (Click) කර Google Form පත්‍රය පුරවා ඔබගේ අයදුම්පත යොමු කරන්න.

ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් (50) ඉල්ලුම් නොකළහොත් පාඨමාලාව ආරම්භ නොකෙරෙන බව කාරුණිකව සලකන්න.

විමසීම් සඳහා - 0117-601755 / 0117-601746

WhatsApp - 077 5409755/ 071 8029097 sudharshini1976@gmail.com

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය